1

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (ශිල්පීය නොවන) නිලධර ගණයට අයත් තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

## 01.සම්බන්ධ වන ආයතන

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව :- ජාතික කෞතුකාගාර | යොමු අංකය:- ජා.කෞ.ආ/වි1/95(VI)<br>PL1/2006 | දිනය:-2011.09.30 |
| 1.2 | අමාත්‍යාංශය :- ජාතික උරුමයන් පිළිබඳ | යොමු අංකය:- NH/1/9/1/26 | දිනය:- 2012.02.01 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කිරීම :- | යොමු අංකය:-DMS/C04/29 -03 | දිනය:-2011.06.30 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :- | යොමු අංකය:-EST-3/RECRU/04/6303<br>EST-3/RECRU/04/6303 | දිනය:-2010.02.16<br>2011.06.27 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :- | යොමු අංකය:- NSCC/4/29/3SR-1 | දිනය: 2011.12.05 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :- | යොමු අංකය:-PSC/EST/3/1/23/2012 | දිනය:- 2012.03.15 |

## 02.පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා:- රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ

## 03. නිලධර ගණය පිළිබඳ විස්තර

3.1 නිලධර ගණය : ප්‍රාථමික - ශිල්පීය නොවන

3.2 ශ්‍රේණි :-III,II,I හා විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කිරීම හා පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවයන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහු කාර්යය නිලධර ගණයක් ලෙස මෙම නිලධර ගණය සැලකේ.මෙම කාර්ය පථයනට අයත් කාර්යය අතුරින් ඕනෑම කාර්යභාරයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම නිලධර ගණයට පවරනු ලැබේ.

**04. තනතුරේ ස්වභාවය** මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

**05.වැටුප්**

5.1 වැටුප් කේත අංකය :-PL -1-2006 (අ)

5.2වැටුප් පරිමාණය :-රු 11,730-10x120-10 x130-10 x145-12 x160-17,600

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | 11,730 |
| II | පියවර 12 | 13,060 |
| I | පියවර 22 | 14,375 |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | 15,840 |

## 06. නිලධර ගණයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්-

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| කෞතුකාගාර සහායක | 141 | කෞතුකාගාර මැදිරි භාර රාජකාරි, කෞතුක භාණ්ඩ එක් රැස් කිරීම සම්බන්ධ රාජකාරි, ටිකට්පත් අලෙවි කිරීම, කෞතුකාගාර ප්‍රකාශන අලෙවි කිරීම, ඡායාරූප ශිල්පීට සහාය වීම, කෞතුකාගාර ජංගම බස්රථය පිරිසිදු කිරීම හා එහි සහායක ලෙස කටයුතු කිරීම යන රාජකාරි අවශ්‍යතාවය පරිදි ඉටු කිරීම හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| කෞතුකාගාර මුරකරු | 40 | කෞතුකාගාරයේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම දැරීම හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| පුස්තකාල සහායක | 02 | පුස්තකාලයාධිපතිට සහාය වීම හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| මුර පරීක්ෂක | 01 | කෞතුකාගාරයේ සහ භූමියේ සියළු ස්ථානවල ,කාමරවල දේපළ වල සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් වගකීම දැරීම හා මුරකරු දෛනික රාජකාරි පිළියෙළ කිරීම ,ඔවුන් පාලනය කිරීම හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| සහකාර මුර පරීක්ෂක | 01 | රාත්‍රී කාලයේ කෞතුකාගාරයේ සේවයේ නියුතු මුරකරුවන් නිසිලෙස ස්ථානගත කර භාර ඔවුන්ගේ රාජකාරි අධීක්ෂණය හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |

6.2 විෂයබද්ධ නිලධර සංඛ්‍යාව:-

| | |
|---|---|
| කෞතුකාගාර සහායක | 141 |
| කෞතුකාගාර මුරකරු | 40 |
| පුස්තකාල සහායක | 02 |
| මුර පරීක්ෂක | 01 |
| සහකාර මුර පරීක්ෂක | 01 |
| **මුළු තනතුරු සංඛ්‍යාව** | 185 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III , II, I හා විශේෂ ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිළධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**සටහන** :- දැනට PL -1-2006 ඒ වැටුප් ලබන දෙපාර්තමේන්තුගත තනතුරු වන ජංගම බස්රථ පවිත්‍රකරු ,අඳුරු කාමර සේවක ,විකුණුම් සහකාර , ටිකට් සහකාර ,ආදර්ශ භාණ්ඩ රැස්කරු හා මැදිරි භාරකරු තනතුරුද කෞතුකාගාර සහායක තනතුරු i4\ 120 ට ඇතුලත් කර ඇති බැවින් කෞතුකාගාර සහායක ශ්‍රේණි උසස් කිරීම එම තනතුරු සඳහාද අදාල වේ.නව බඳවා ගැනීම් කළ යුත්තේ කෞතුකාගාර සහායක හා කෞතුකාගාර මුරකරු තනතුරට පමණි.

## 07.බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත සම්පූර්ණයෙන්ම බාහිර අයදුම් කරුවන්ගෙන් | 100% |
| සීමිත | අදාල නොවේ |
| කුසලතා | අදාල නොවේ |

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය :- III වන ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 6ක් සමත්වී තිබීම.

7.2.2.2. වෘත්තිය සුදුසුකම් :- අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තිය පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.3 පළපුරුද්ද :- අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තිය පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ,තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි /ගැසට් පත්‍රයෙහි සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව :- අවුරුදු 45 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය:- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි

7.2.4.1 ලිඛිත විභාගය - අදාල නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාල නොවේ.

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා කරනු ලැබේ.

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාල නොවේ |
| 2. පළපුරුද්ද | 40 | |
| 3. තනතුරට හිමි ක්ෂේත්‍රයට අදාලව රජය පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා හා ලබා ඇති පුහුණුව | 15 | |
| 4. ක්‍රීඩා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් | 20 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී පිළිබිඹු කරන ආකල්ප හා පෞරුෂය සඳහා | 05 | |

සටහන :- අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතා අනුපිළිවෙලින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

7.2.4.3.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ

හා/හෝ

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටු කර ගැනිමට අපේක්ෂිත අරමුණු :- අදාල නොවේ.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:- අදාල නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය:-

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පලකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීම හෝ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම් පත් කැඳවනු ලැබේ

7.3 සීමිත බඳවා ගැනිම- අදාල නොවේ

7.4 කුසලතා මත බඳවා ගැනිම - අදාල නොවේ

## 08.කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය<br>ලිඛිත පරීක්ෂණය/වෘත්තිය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණයකි |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණයකි |

(කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල විෂය නිර්දේශයන් ඇමුණුම 01,02,03 හි දක්වා ඇත.)

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද - වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද

1 වන කාර්යක්ෂමතා කඩඉම :- ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

2 වන කාර්යක්ෂමතා කඩඉම :- ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

3 වන කාර්යක්ෂමතා කඩඉම :- ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

## 09.රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

| ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1. නිලධර ගණයෙහි III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්:-

10:1:1:1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයා ගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම
VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය - සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයින් විසින් නියමිත ආකෘතිය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.1.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව

10.1.2.1සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. නිලධර ගණයේ III ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත දිනට වැටුප් වර්ධක හය(06) ම උපයාගෙන තිබීම

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර හය (06) තුලම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුලදී ලබා ගෙන තිබීම

VI. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

(සුවිශේෂී කාර්ය සාධනයට අයත් විෂය නිර්දේශය ඇමුණුම් 04 න් දැක් වේ.)

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයින් විසින් නියමිත ආකෘතිය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සටහන:-

- සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබා ගත යුතුය.තවද සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.
- නිලධරයෙකු පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී ,පසුව පැවැත්වෙන අභියෝගතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක.එවැනි නිලධරයෙකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දින වේ.

**10.2. සේවක ගණයෙහි II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්.

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. නිලධර ගණයේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයා ගෙන තිබීම

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

1. සේවා ගණයේ II ශ්‍රේණියේ වසර අට (08) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට(08) ම නියමිත දිනට උපයා ගෙන තිබීම

11. උසස් වීම් දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

111. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර අට (08) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1V. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත කාලය තුළදී සමත් වී තිබීම.

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයින් සඳහා පත්කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා නිලධරයන් II ශ්‍රේණියට උසස් වී වසර අට (8) ක් සම්පූර්ණවන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙන ආකාරය ඇමුණුම 05 හි දැක්වේ.

10.3 . I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන් :-

10.3.1.1සපුරාලිය යුතු සුදුසුකම් :

I. නිලධර ගණයේ 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක (09) ක් උපයාගෙන තිබීම

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නම වසර පහ(05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පර්පාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

IV. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

10.3.1.2උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීමේ බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**සංලක්ෂය-( සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වන පරීක්ෂණවලට පෙනී සිටීම)**

සුවිශේෂී කාර්යසාධනය ඇගයීමේ කමවේදයක් රජය විසින් හඳුන්වාදී කියාත්මක කරන තෙක් දැනට කියාත්මක වන වාර්ෂික කාර්යසාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනුලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝගාත්‍යතා පරීක්ෂණය/ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් |
|---|---|
| මුර පරීක්ෂක | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයෙහි විශේෂ ශ්‍රේණියෙහි සේවකයෙකු වීම |
| සහකාර මුර පරීක්ෂක | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයෙහි I ශ්‍රේණියෙහි සේවකයෙකු වීම |
| පුස්තකාල සහායක | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයෙහි II ශ්‍රේණියෙහි සේවකයෙකු වීම |

සටහන :- ඉහත සුදුසුකම් සපුරා ඇති සේවකයින් නොමැති අවස්ථා වලදී සේවයේ යෙදී සිටින ප්‍රාථමික ශිල්පීය නොවන නිලධර ගණයෙහි නිලධරයින් අතුරින් ජ්‍යෙෂ්ඨතාව අනුව තනතුරු වලට පත් කරනු ලැබේ.

11.2 තෝරා ගනු ලබන ක්‍රමය :-

ජ්‍යෙෂ්ඨතාවය අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව

12.රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:

12.1 කාර්යයන් පැවරීම :- ශ්‍රේණිගතව කාර්යයන් හැවරීමක් සිදු නොකරන අතර මෙම නිලධර ගණයකට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ

13:1 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නෙය.

14. සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අනුව අන්තර්ග්‍රහණය කිරීම (නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ) ඇමුණුම අංක 06 හි දැක්වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධි විධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධි විධාන සඳහා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන :.................................

(විෂය භාර නිලධරයා )

නම : ආර්.ඩී.එස්.එස්.රණවීර

තනතුර : රා.ක.ස II

දිනය : 2012.05. 09

පරීක්ෂා කළේ අත්සන :.........................

(විෂය භාර මාණ්ඩලික නිලධරයා )

නම : එච්.ඩී.ඩී.සී.පී.කේ. තිලකරත්න

තනතුර : සහකාර අධ්‍යක්ෂ පාලන ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ 07

දිනය : 2012.05. 11

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :.............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :........ ආචාර්ය නන්දා වික්‍රමසිංහ

තනතුර:........ අධ්‍යක්ෂ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ 07

නිල මුද්‍රාව:..............................

දිනය:- 5 | 11

යොමු අංකය :- NH/1/19/6/26

කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ නි. (ප්‍රාථමික ශ්‍රේණිය නොවන) නිලධර [illegible] යට අයත් තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:- [signature]

නම:-

ලේකම්

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

කාන්ති විජේතුංග
ලේකම්
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
08 වන මහල. "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

දිනය:- 2012-05-18

නිල මුද්‍රාව:

---

යොමු අංකය :- PSC/EST/3/1/23/2012

කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ [illegible] නි. (ප්‍රාථමික ශ්‍රේණිය නොවන) නිලධර ගණයට [illegible] තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2012-03-15 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන:- [signature]

නම:-

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට
කොළඹ-05.

දිනය:- 2012 09 [illegible]

නිල මුද්‍රාව:

ඇමුණුම -01

# 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර :-

| ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | 30 | 40 |
| 2) සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව දැනුම | 30 | |
| 3) තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවයක් අත්පත් කරගෙන දැයි මැන බැලීම | 40 | |
| මුළු ලකුණු | 100 | |

02. විභාගය පවත්වනු ලබන බලධරයා : - ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂක විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් (වාචික පරීක්ෂණය)

03 .විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

සකස් කළේ : අත්සන :.................................

(විෂය භාර නිළධරයා )

නම : ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර : රා.ක.ස II

දිනය : 2012.05.09

පරීක්ෂා කළේ - අත්සන :.........................

(විෂය භාර මාණ්ඩලික නිළධරයා )

නම : එච්.ඩී.ඕ.සී.පී.කේ තිලකරත්න

සහකාර අධ්‍යක්ෂ (පාලන)

තනතුර : ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ 07

දිනය : 2012.05.11

අත්සන:-.................................... .........

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:-......ආචාර්ය නන්දා වික්‍රමසිංහ..............

අධ්‍යක්ෂ

තනතුර:-...ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව ..........

කොළඹ-07

දිනය:-......5.11............. .... ..........

ඇමුණුම -02

## 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01 ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර :

| ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | 30 | 40 |
| 2) සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව දැනුම | 30 | |
| 3) තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවයක් අත්පත් කරගෙන දැයි මැන බැලීම | 40 | |
| මුළු ලකුණු | 100 | |

පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයනට අදාලව ගත වූ සේවා කාලය තුළ අදාල ක්ෂේත්‍රයේ සිදු වී ඇති පරිපාටිමය, නිතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම හා ඔහුගේ කාර්යයනට අදාල නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මෙහිදී මැන බැලේ.

02.විභාගය පවත්වනු ලබන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂක විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් (වාචික පරීක්ෂණය)

03 විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

සකස් කළේ : අත්සන :..............................

(විෂය භාර නිළධරයා )

නම : ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර : රා.ක.ස III

දිනය : 2012/05/09

පරීක්ෂා කළේ අත්සන :........................

(විෂය භාර මාණ්ඩලික නිළධරයා )

නම : එච්.ඩී.ඩී.සී.පී.කේ තිලකරත්න

තනතුර : ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

දිනය : 2012-05-11

අත්සන:-..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානී) ආචාර්ය නන්දා වික්‍රමසිංහ

අධ්‍යක්ෂ

තනතුර:-.............................. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ-07

දිනය:-....5/11.............

ඇමුණුම 03

## 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර :

| ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | 30 | 40 |
| 2) සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබදව දැනුම | 30 | |
| 3) තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවයක් අත්පත් කරගෙන දැයි මැන බැලීම | 40 | |
| මුළු ලකුණු | 100 | |

පළමු වන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයනට අදාලව ගත වූ සේවා කාලය තුල අදාල ක්ෂේත්‍රයේ සිදු වී ඇති පරිපාටිමය,නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම හා ඔහුගේ කාර්යයනට අදාල නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මෙහිදී මැන බැලේ.

03. 03.විභාගය පවත්වනු ලබන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂක විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් (වාචික පරීක්ෂණය)

04 විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමා[illegible] වග :වසරකට දෙවරක්

සකස් කළේ : අත්සන :...............................

(විෂය භාර නිළධරයා )

නම : ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර : රා.ක.ස II

දිනය : 2012/05/09

පරීක්ෂා කළේ අත්සන :...............................

(විෂය භාර මාණ්ඩලික නිළධරයා )

නම : එච්.ඩී.ඩී.සී.පී.කේ. තිලකරත්න

තනතුර : සහකාර අධ්‍යක්ෂ පාලන ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ 07

දිනය : 2012.05.11

අත්සන:-...................ආචාර්ය නන්දා වික්‍රමසිංහ අධ්‍යක්ෂ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ-07 තනතුර:-...............................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:-............................................ දිනය:-..5/11

**ඇමුණුම -04**

01විභාගයේ නම :- **සුවිශේෂී කාර්ය සාධනය යටතේ III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් වීමේ විභාගය**

විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝගතා පරීක්ෂණය | පැය 02 | 100% | 60% |

02. විභාගය පවත්වනු ලබන බලධරයා:

**ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්**

03.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට [illegible] යන වග: **වසරකට වරක්**

04.විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | **විෂයය නිර්දේශය** |
|---|---|
| අභියෝගතා පරීක්ෂණය | **තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන කාර්යය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ වන දැනුම කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේද යන්න මැන බැලීමේ පරීක්ෂණයක්** |

සකස් කළේ:

අත්සන:-..............................

නම:-. ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර:- රා.ක.ස 11

දිනය:- 2012/05/09.

පරීක්ෂා කළේ:-

අත්සන:-..............................

නම:- එච්.ඩී.ඩී.සී.පී.කේ. තිලකරත්න
සහකාර අධ්‍යක්ෂ පාලන

තනතුර:- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

දිනය:- 2012.05.11

අත්සන:-.............................. (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:- ආචාර්ය නන්දා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ

තනතුර:- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

දිනය:- 5/11

**ඇමුණුම -05**

01. විභාගයේ නම :- **සුවිශේෂී කාර්ය සාධනය යටතේ II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීමේ විභාගය**

විභාගය පිළිබඳ විස්තර :

| පරීක්ෂණය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය | 100% | 50% |

02.විභාගය පවත්වනු ලබන බලධරයා:

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

03.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: වසරකට වරක්

04.විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. රාජකාරී කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් ( එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින්) | 50 |
| 2. කාර්යය සාධනය ඇගයීම (උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා)<br>ඉතා හොඳයි - ලකුණු 09<br>හොඳයි - ලකුණු 06<br>සතුටුදායකයි - ලකුණු 03 | 45 |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය සඳහා | 05 |

සකස් කළේ:

අත්සන:-..............................

නම:-. ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර:- රා.ක.ස 11

දිනය:- 2012/05/09

පරීක්ෂා කළේ:-

අත්සන:-..............................

නම:- එච්.ඩී.ඩී.සී.පී.කේ. තිලකරත්න

තනතුර:- සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

දිනය:- 2012.05.11

අත්සන:-.............................. (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:- ආචාර්ය නන්දා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ

තනතුර:- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

දිනය:- 5/11

<u>ඇමුණුම -06</u>

## සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම

(නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.)

නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(iv) මගින් ලබා දී ඇති PL 1-2006 (ඒ )වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධරයින් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධි විධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කොට ගෙන සේවා කාලය ගණන් ගත යුතුය.කෙසේ වතුදු ,අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර ,එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළග ඉහළ වැටුප් පියවරේ ගැබීමද සිදු නොකළ යුතුය.

(I) PL I-III ශ්‍රේණිය

(අ) PL 1-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයින්,

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින්,

PL I-III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(II) PL I- II ශ්‍රේණිය

(අ) PL 1-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහයක (10 ) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා අවම වශයෙන් වැටුප් වර්ධක දහය (10) ක් උපයා ඇති සහ නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින්

(ආ) PL 1-2006 ඒ වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයින්

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද , නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින්

PL I-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(111) PL I-I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 30 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක විස්ස (20) ක් උපයා ගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 19 කට අඩු සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක අවම වශයෙන් නමය (09) ක් උපයා ගෙන ඇති සහ ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින්

(ඇ) PL 1-2006 (ඒ) වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධරයින්

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු 09 සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයින්

PL I-Iශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතු වේ.

(1v) PL I- විශේෂ ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක අවම වශයෙන් තිහ (30) ක් උපයා ගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 19 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක දහ නවය(19)ක් උපයා ගෙන ඇති සහ ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින්

(ඈ) ඉහත සදහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක අවුරුදු 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක නවය(09) ක් උපයාගෙන ඇති හා ඉහත සදහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයින්

(ඇ) PL 1-2006 (ඒ) වැටුප් පරිමාණයේ විශේෂ ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන නිලධරයින්

PL I- විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ:

අත්සන:-..........................................

නම:- ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර:- රා.ක.ස II

දිනය:- 2012/05/09.

පරීක්ෂා කළේ:

අත්සන:-..........................................

නම:- එච්.ඩී.ඩී.සී.පී.කේ. තිලකරත්න

තනතුර:- සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

දිනය:- 2012.05.11

අත්සන:-..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම:- ආචාර්ය. නන්දා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ

තනතුර:- ජාතික. කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

දිනය:- 5/11